# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

# 1994 අංක 14 දරන
# දඹදෙණිය රජමහා විහාර සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1994 ජූනි මස 20 වන දින]

1994 ජූනි මස 24 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1994 අංක 14 දරන දඹදෙණිය රජමහා විහාර සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත.

[සහතිකය සටහන් කළේ 1994 ජූනි මස 20 වන දින.]

එල්. ඩී.—ඕ. 63/92

## දඹදෙණිය රජමහා විහාර සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

“ දඹදෙණිය රජමහා විහාර සංවර්ධන පදනම ” යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන පදනමක්, ඒ පදනමේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව ඒ පදනමට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

ඒ පදනම පිහිටුවන ලද්දේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද ඒ පරමාර්ථ සහ කරුණු ඒ පදනම විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් සහ ඒ පදනම සංස්ථාගත කිරීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1994 අංක 14 දරන දඹදෙණිය රජමහා විහාර සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට සහ ඉන් පසු, (මෙහි මින්මතු “ පදනම ” යනුවෙන් සඳහන් කරනු ලබන) දඹදෙණිය රජමහා විහාර සංවර්ධන පදනමේ දැනට සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින්මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරගනු ලබන තැනැත්තන් “ දඹදෙණිය රජමහා විහාර සංවර්ධන පදනම ” යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින්මතු “ සංස්ථාව ” යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් වන අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද සම්පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. තවද එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවලදී නඩු පවරනු ලැබිය හැකි ය. දඹදෙණිය රජමහා විහාර සංවර්ධන පදනම සංස්ථාගත කිරීම.

3. සංස්ථාව සංස්ථාපනය කිරීමට අරමුණු කොට ගත් පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) දඹදෙණි රජමහා විහාරස්ථානය සතු ගොඩනැගිලි නඩත්තු කරගෙන යාම සඳහා ආධාර කිරීම සහ අවශ්‍ය වන පරිදි නව ගොඩනැගිලි ඉදිකිරීම සහ ඒවා නඩත්තු කිරීම;

(ආ) බුද්ධ ධර්මය ප්‍රචාරය කිරීමේ කටයුතුවල යෙදීම සහ සිංහල, පාලි සහ සංස්කෘත යන භාෂා ඉගෙන ගැනීම ප්‍රවර්ධනය කිරීම ;

(ඇ) ශ්‍රී ලංකාවෙහි සහ විදේශයන්හි ධර්මදූත සේවා ප්‍රවර්ධනය කිරීම ;

(ඈ) සාමණේර භික්ෂූන් සඳහා අභ්‍යාස විද්‍යාලයක්, පිරිවෙන්, දහම් පාසල් පිහිටුවීම සහ බෞද්ධ ධර්මය පිළිබඳ පර්යේෂණ පැවැත්වීම ;

(ඉ) බෞද්ධ ජනතාව තුළ සහ ප්‍රදේශවාසී ජනතාව තුළ ශාසනික ප්‍රබෝධය ඇති වන සේ කටයුතු සංවිධානය කිරීම ;

(ඊ) සාමාජිකයන්ගේ ආගමික, සංස්කෘතික, සමාජයීය හා භෞතික සුබසාධන සේවා ප්‍රවර්ධනය කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් ආරම්භ කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම, ආධාර මුදල් හෝ පරිත්‍යාග පිළිගැනීම හෝ එකතු කිරීම, සංස්ථාවේ අරමුදල් ආයෝජනවල යෙදවීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටුකිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීම, සේවයේ නියුක්ත කිරීම සහ සේවයෙන් පහකිරීම ද ඇතුළුව සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් ඉටුකර ගැනීම සඳහා සහ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කාරණා සහ දේ කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ රීතිවලට යටත්ව, සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ නිලදරන්තන්ගෙන් සහ එකී රීතිවලින් විධිවිධාන සලසා ඇති පරිදි වූ සහ ඒ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන සාමාජිකයන් සංඛ්‍යාවකගෙන් සමන්විත වූ විධායක කාරක සභාවක් විසින් පරිපාලනය කළ යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේදී නිල දැරූ පදනමේ විධායක කාරක සභාව සංස්ථාවේ ප්‍රථම විධායක කාරක සභාව විය යුතු ය.

භාරකාර මණ්ඩලය

6. (1) සංස්ථාවේ සියලු නිශ්චල දේපළවල භාරකාරත්වය සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත් කරගනු ලබන සාමාජිකයන් සංඛ්‍යාවකින් සමන්විත වූ භාරකාර මණ්ඩලයක් වෙත සංස්ථාවේ රීතිවලට යටත්ව තිබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම භාරකාර මණ්ඩලය, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී නිලදැරූ පදනමේ භාරකාර මණ්ඩලය විය යුතු ය.

සංස්ථාවේ රීති.

7. (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ අස්වීම හෝ ඔවුන් නෙරපීම සම්බන්ධයෙන් ද, නිල දරන්නන්, විධායක කාරක සභාව සහ භාරකාර මණ්ඩලය තෝරාපත් කර ගැනීම සඳහා ද සංස්ථාවේ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ හා සේවකයන්ගේ කාර්ය ඉටුකිරීම සම්බන්ධයෙන් සහ සංස්ථාවේ, විධායක කාරක සභාවේ සහ භාරකාර මණ්ඩලයේ රැස්වීම්වල කටයුතු කරගෙන යාමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් ද සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම සඳහා හා එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා ද සංස්ථාව විසින් කලින් කල සාමාජිකයන්ගේ මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේය. එකී රීති සෑදීමෙන් පසු එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළහැකි වන්නේ ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

පදනමෙන් ගෙවිය යුතු සහ පදනමට අයවිය යුතු ණය.

8. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී පදනමේ පැවති සියලුම ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළයුතු අතර, එදිනට පදනමට අයවිය යුතු හෝ ගෙවිය යුතු සියලුම ණය, දායක මුදල් සහ සම්මාදම් මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

9. යම් මිළට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් හෝ සංස්ථාව සතු වන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපලක්, 6 වන වගන්තියේ විධිවිධානවලට සහ සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව භාර ගැනීමට සහ දැරීමට නීතියෙහි ලා සංස්ථාවට බලය ඇති අතර, ඒ දේපළ විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන් ආකාරයකින් බැහැර කිරීමට පූර්ණ බලය ඇතිව මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපල දැරිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

10. සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති තැනැත්තන් සංඛ්‍යාවක් ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු ය. එකී තැනැත්තන් විසින් තමන් පැමිණ

සිටි බවට සළකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිර විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

11. මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් වෙතින්, ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් කියන වෙනත් තැනැත්තන්ගේ හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම් වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු බව.

12. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත් විය යුතු ය.

පාර්ලිමේන්තු හැන්සාඩ් කාණ්ඩ සහ කොටස් වෙළුම්වල සහ පත්‍රවල වාර්ෂික දායක මුදල (දේශීය) රු. 570 යි (විදේශීය) රු. 1,190 යි. අංක 255, බෞද්ධාලෝක මාවත, කොළඹ 7. රජයේ ප්‍රකාශන කාර්යාලයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා පිටපත් ලබාගත හැකිය.